www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නැගෙනහිර යුරෝපයේ අර්බුදය සහ 1989 පාඩම්

**The crisis in eastern Europe and the lessons of 1989**

## 2009 ජනවාරි 26

මීට විසි වසරකට ඉහත දී නැගෙනහිර යුරෝපය තුල, පුලුල් විරෝධතා රැල්ලක් මගින්, 1989 වසර මුල දී ස්ථාවර ලෙස බලයේ රැඳී සිටි බවක් පෙනී ගිය ස්ටැලින්වාදී තන්ත්‍ර අතුගා දමන ලදි. ජූනි මාසයේ දී සොලිඩැරිටි ව්‍යාපාරය පෝලන්තයේ පාර්ලිමේන්තු මැතිවරන ජය ගත් අතර ඔක්තෝබරයේ දී හංගේරියාව ධනේශ්වර ව්‍යවස්ථාවක් සම්මත කලේය. නොවැම්බරයේ දී බල්ගේරියාවේ ස්ටැලින්වාදී තන්ත්‍රය ද සමග බර්ලින් තාප්පය පෙරලා දැමුනි. ඊලගට ඇද වැටුනේ චෙකෝස්ලෝවැකියාවේ ආන්ඩුවයි. එමෙන් ම රුමේනියාවේ ස්ටැලින්වාදී ආඥාදායක චව්චෙස්කු වෙඩික්කාර හට කන්ඩායමක් විසින් වෙඩි තබා මරා දමන ලදි.

මෙම දේශපාලන භූමිකම්පා ලිහාහැරි ව්‍යාපාරවලට පුලුල් නමුත් විසිරුනු සමාජ පදනමක් තිබුනි. වැඩි ප්‍රජාතන්ත්‍රවාදයක් හා වඩා හොඳ ජීවන කොන්දේසි පිලිබඳ ආශාවන් ඒවාට ගාමකය සැපයූ නමුදු එම ඉලක්කයන් සාක්ෂාත් කර ගන්නේ කෙසේ ද යන්න පිලිබඳ කිසිදු පැහැදිලි අදහසක් එම ව්‍යාපාරවලට නොතිබුනි. ජනගහනයේ අතිමහත් බහුතරයකින් සමන්විත වූ කම්කරු පන්තියට කිසිදු ස්වාධීන ඉදිරිදර්ශනයක් තිබුනේ නැත. දශක ගනනාවක් තිස්සේ පාලක නිලධරයේ දේශපාලන මර්දනය ද ස්ටැලින්වාදය විසින් මාක්ස්වාදය මුසාකරනයට ලක් කිරීම ද මගින් කම්කරු පන්තිය සැබෑ මාක්ස්වාදයේ සම්ප්‍රදායන්ගෙන් බිඳිනු ලැබ තිබුනි.

මෙම කොන්දේසි යටතේ සුලුතරයක් ධනවාදය පුනස්ථාපනය කරනු පිනිස මූලිකත්වය ගත්තේය. ස්ටැලින්වාදී නිලධරයෝ," සමාජවාදයේ අසාර්ථකත්වය " ප්‍රකාශයට පත් කරමින්, ඔවුන් සමග එක්වී ජනසතු නිෂ්පාදන බලවේගවල දැවැන්ත කොටස් ස්වකීය පුද්ගලික දේපොල ලෙස පවරා ගැනීම මගින් සිය වරප්‍රසාද සහතික කර ගත්හ. ජනගහනයේ බහුතරය දැවැන්ත වන්දියක් ගෙවීය. නැගෙනහිර යුරෝපය පුරා සමාජ ජීවිතය ගුනාංගීකරනය කෙරී ඇත්තේ, විරැකියාව, මහජන දරිද්‍රතාව, පොදු කාර්ය ව්‍යුහයේ හා සෞඛ්‍ය හා අධ්‍යාපන ක්‍රමවල බාදනය සහ පැහැදිලි සමාජ අසමානතාව මගිනි.

දැන්, ස්ටැලින්වාදී තන්ත්‍ර පෙරලා දැමීමෙන් වසර 20කට පසුව, නව විරෝධතා රැල්ලක් පැන නැගෙන බවට ඇගවුම් පවතී. මෑත දිනවල ලැට්වියාවේ, ලිතුවේනියාවේ හා බල්ගේරියාවේ තියුනු ගැටුම් සිදු විය.

ජනවාරි 13 දා, ලැට්වියානු අගනුවර වන රිගා නගරයට රැස්වූ 10,000ක් ජනයා ආන්ඩුවේ විවෘත ධ්වජභංගයට හා දූෂනයට එරෙහිව විරෝධතා දැක්වූහ. විරෝධතාකරුවෝ හිම බෝල ද පොලීසියට අනුව මොලටොව් කොක්ටේල් කිහිපයක් ද විසි කලහ. පොලීසිය කඳුලු ගෑස් ප්‍රහාරයක් එල්ල කොට, විරෝධතාකරුවන් 126ක් අත්අඩංගුවට ගෙන 28කට තුවාල සිදු කරමින් ප්‍රතිචාර දැක්වීය.

දින කිහිපයකට පසුව, අසල්වැසි ලිතුවේනියාවේ ද ඊට සමාන සිද්ධියක් සිදු විය. විල්නියුස් අගනුවර පැවති වෘත්තීය සමිති විරෝධතා දැක්මකට පසුව, විරෝධතාකරුවෝ රටේ පාර්ලිමේන්තුව වෙත හිම බෝල, බිත්තර, බෝතල් හා ගල්වලින් දමා ගැසූහ. පොලීසිය කඳුලු ගෑස් හා රබර් උන්ඩ ප්‍රහාරවලින් ප්‍රතිචාර දැක්වීය.

යුරෝපා සංගමය දාම ප්‍රතික්‍රියාවකට මුහුන දී සිටී. *ෆිනෑන්ෂල් ටයිම්ස්* මෙසේ ලිවීය: "බොහෝ ආන්ඩු තුනී බහුතරයන් මත රදා පවතින නැතහොත් හෙලත්තාඩු සභාග මත පාදක වන සමස්ත කලාපය පුරා ම මහජන විරෝධතා පැතිර යා හැකි බවට වැඩෙන උත්සුකතාවක් බ්‍රසල්ස්හි පවතී."

මෙම උත්සුකතා මුලුමනින් ම යුක්තිසහගත ය. ජාත්‍යන්තර මූල්‍ය හා ආර්ථික අර්බුදය නැගෙනහිර යුරෝපය වෙත දැවැන්ත ඇගවුම් ගෙන එයි. එය මගින් බිඳ දමනු ලබන්නේ, එහි ජාතික ආර්ථිකයන් පමනක් නොවේ. මෙම රටවල ධනවාදය පුනස්ථාපනය සමග බැඳුනු දෘෂ්ටිවාදාත්මක සංකල්පයන් ද එමගින් බිඳ දැමෙමින් තිබේ.

සාපේක්ෂව ඉහල ආර්ථික වර්ධන අනුපාතික, විදේශ ආයෝජන, යුරෝපා සංගමයට ඇතුලුවීම සහ මධ්‍යම පන්තික ස්ථරයක සමාජ නැග්ම, ආර්ථික දුෂ්කරතාවලින් යුක්ත ආරම්භක කාලපරිච්ඡේදකට

පසුව ආර්ථික හා සමාජ තත්වය වැඩි දියුනු වනු ඇතැයි යන බලාපොරොත්තු දිරිගැන්වීය.

දැන් මෙම මිථ්‍යාවන් බිඳ දැමෙමින් පවතී. ජාත්‍යන්තර ආර්ථික අර්බුදය නැගෙනහිර යුරෝපීය ධනවාදයේ පරපුටු හා අර්ධ-සාපරාධී ස්වභාවය මිලේච්ඡ ලෙස එලිදරව් කර ඇත. ධනවාදී" ප්‍රතිනිර්මානයේ" 20 වසරක ප්‍රතිඵලය වී ඇත්තේ නය කන්දක් සහ සමස්ත රාජ්‍යයන් ම මත ලඹදෙන බංකොලොත්කමයි.

නැගෙනහිර යුරෝපයේ ලාභ ශ්‍රමය සූරාකෑම මගින් අධික ලාභ ගරාගත් ජාත්‍යන්තර ව්‍යාපාරික ආයතන සිය භාන්ඩ සඳහා වන ඉල්ලුම හැකිලෙන තතු තුල මහා පරිමානයෙන් කම්කරුවන් දොට්ටදැමීම් ක්‍රියාවට දමමින් සිටී. නැගෙනහිර යුරෝපය තුල ඉහල ලාභ ඉපැයූ බටහිර යුරෝපීය බැංකු සිය ආයෝජන ඉවත් කරගනිමින් සිටී. රාජ්‍ය දේපොල පුද්ගලීකරනය මගින් සුපිරි ධනවතුන් බවට පත්වූ පාලක ප්‍රභූහු දැන් අර්බුදයේ වන්දිය මහජනතාව මත හෙලමින් සිටිති.

ඔවුන් එය සිදු කරන්නේ යුරෝපා සංගමය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සමීප සහයෝගීතාවයකින් යුක්තව ය. ලැට්වියාවේ විරෝධතා, පුලුල් පරාසයකින් යුක්ත පටි තද කර ගැනීමේ පියවරයන්ට ඇඳ තිබුනු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මූල්‍ය ආධාර වැඩපිලිවෙලකට සෘජු ප්‍රතිචාරයක් විය. එලඹෙන වසරේ දී ලැට්වියාවේ ආර්ථිකය අඩු ගනනේ සියයට 5කින් හැකිලෙනු ඇතැයි ද විරැකියාව සියයට 10කින් ඉහල යනු ඇතැයි ද බලාපොරොත්තු වේ.

විසි වසරක ධනේශ්වර පුනස්ථාපනය කිසිදු කල් පවතින වටිනාකමක් හෝ අර්බුදයට මුහුන දීමේ කිසිදු හැකියාවක් ඉතිරි කර තබා නැත. බටහිර යුරෝපීය බැංකු සහ ව්‍යාපාරික ආයතන නැගෙනහිර යුරෝපය ක්‍රමානුකූලව කොල්ලකා ඇති අතර දේශීය ප්‍රභූහු අතරමැදියන් ලෙස ක්‍රියාකරමින් කොල්ලයේ තමන්ගේ ම කොටස ඩැහැගෙන තිබේ. දැන් මූල්‍ය ප්‍රාග්ධනය ඉවත්කර ගැනෙමින් පවතින්නේ, රාජ්‍ය පමනක් නොව සාමාන්‍ය පුරවැසියන් ද නය කන්දකට යට කරමිනි.

කුරියර් නමැති ඔස්ට්‍රියානු පුවත්පතේ පල වූ වාර්තාවකට අනුව, නැගෙනහිර යුරෝපීය කුටුම්භවල ආදායමෙන් සියයට 30ක් නය ආපසු ගෙවීම සමග බැඳී ඇත. යුක්රේනය, රුමේනියාව, හංගේරියාව හා ස්ලෝවේනියාව තුල මෙම ප්‍රතිශතය මීටත් වඩා ඉහලය. යුරෝ කලාප රටවල මෙම ප්‍රතිශතය පවතින්නේ සියයට 10 මට්ටමේය.

ජාතික අයවැය ලේඛන ද දැවැන්ත නය බරින් වෙලී ඇත. නරකම තත්වය පවතින්නේ මිලියන 46ක ජනගහනයකින් යුක්ත යුක්රේනයේ ය. එම රට බංකොලොත්භාවයට මුහුන දී ඇති අතර එයට අලුතෙන් නය ලබා ගත හැක්කේ දැරිය නොහැකි තරම් ඉහල පොලී අනුපාතික යටතේ ය. යුක්රේනියානු ආන්ඩුවේ නයකර සියයට 27ක ලාභයක් උපයන අතර එහි විනිමය ඒකකය නිදහසේ පහල වැටේ: හ්‍රිව්න්ජා මුදලේ අගය පසුගිය මාස තුන තුල සියයට 30කින් ඇද වැටී ඇත. දෙසැම්බර් මාසය තුල කාර්මික නිෂ්පාදනය සියයට 27කින් කඩා වැටුනි.

ඒ අතරතුරදී, බටහිර යුරෝපීය බැංකු තමන් වියවුලට හසු විය හැකි යයි බියට පත්ව සිටී. විශ්ලේෂකයන් දැන් නැගෙනහිර යුරෝපය සලකන්නේ ආයෝජකයන් සඳහා විශාලතම අවදානම් සහිත ස්ථානවලින් එකක් ලෙසයි. ඔස්ට්‍රියානු මූල්‍ය ආයතන විශේෂයෙන් ම එම අවදානමට අනාවරනය වී තිබේ. ඔවුන් නැගෙනහිර යුරෝපීය රටවලට යුරෝ බිලියන 224ක නය දී තිබේ. එය වනාහි ඔස්ට්‍රියානු දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට 78කට සමාන මුදලකි. එහෙත් ඉතාලියානු යුනික්‍රෙඩිට්, ජර්මානු හයිපො වෙරීන්ස්බෑන්ක් (එයට අනුබද්ධිත ඔස්ට්‍රියා බැංකුව හරහා), ප්‍රන්ස සොසයිටි ජෙනරල් සහ බෙල්ජියානු කේබීසී ඇතුලු සෙසු යුරෝපීය බැංකු ද කලාපය තුල විශාල වසයෙන් ආයෝජනය කර තිබේ.

නැගෙනහිර යුරෝපයට ආධාර කරන ලෙස යුරෝපා සංගමයට සහ යුරෝපීය මහ බැංකුවට බල කිරීමේ එල්ලයෙන් යුක්තව ප්‍රධාන බැංකු නවයක් ලොබි කන්ඩායමක් තනා තිබේ. විශේෂයෙන් ම මෙම බැංකු ස්වකීය ආයෝජනවල ආරක්ෂාව සඳහා සහතික බලාපොරොත්තු වේ. නැගෙනහිර යුරෝපයේ මහජනතාවන්ට, එම රටවලට ලැබිය හැකි යුරෝපා සංගමයේ මුදල්වලින් ශතයක්වත් නොලැබෙනු ඇත. ඒ වෙනුවට, ඔවුන්ට බල කෙරෙනු ඇත්තේ, සිය ජීවන හා සමාජ මට්ටම්වල කප්පාදු හරහා, බටහිර බැංකු ලබා දෙන ඇප දී ගලවා ගැනීමේ ව්‍යාපෘතිවල වියදමට කර ගැසීමටයි.

ධනේශ්වර පුනස්ථාපනයෙන් අත්පත් කර ගත් දේවල් අහිමි වී ඇතැයි ද බටහිර යුරෝපීය බැංකු බියට පත්ව සිටී. "අපි බොහෝ දෙනෙක් මෙම රටවල් කොමියුනිස්ට්වාදයෙන් නිදහස් කරගනු වස් වසර පනහක් සටන් කර ඇත්තෙමු. දැන් අපට කලාපය තුල, එහි ම ඉරනමට අතහැර දැමිය නොහැකි නිදහස් වෙලඳ පොල ක්‍රමයක් ඇත" යන්න ඔස්ට්‍රියානු රෙයිෆෙයිසෙන් ඉන්ටර්නැෂනල් බැංකුවේ ප්‍රධානි හර්බර්ට් ස්ටෙපික් ෆිනෑන්ෂල් ටයිම්ස් පත්‍රයට දැක්වූ අදහසයි. ඔහුගේ බැංකුව බැංකු නවයේ ලොබි කන්ඩායම එකතු කිරීමෙහි ලා ප්‍රධාන ක්‍රියාකලාපයක් ඉටු කලේය.

නැගෙනහිර යුරෝපයේ කම්කරු පන්තිය 1989න් පාඩම් උකහා ගත යුතු ය. එකල ධනේශ්වර පුනස්ථාපනයේ අද්වකාත්වරුන්ට සාර්ථකත්වය අත්පත් කරගැනීමට හැකි වූයේ කම්කරුවන් අත ස්වකීය ස්වාධීන ක්‍රියාමාර්ගය නොතිබූ නිසාය. එහි ප්‍රතිඵලය වත්මන් ව්‍යසනකාරී තත්වයයි.

එම අවස්ථාවේ දී, හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ධනේශ්වර පුනස්ථාපනයේ අන්තරායන් පිලිබඳව බලගතු අනතුරු ඇගවීම් නිකුත් කලේය. "කම්කරුවන් (ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ප්‍රධානීන් වන) හොනෙකර්, මීල්කේ, ක්‍රෙන්ස් සහ සමස්ත ස්ටැලින්වාදී මාෆියාව පෙරලා දමා ඇත්තේ, ලෝක යුද්ධ දෙක සංවිධානය කලා වූ ද කම්කරුවන් සඳහා රැඳවුම් කඳවුරු ඉදි කලා වූ ද ධනේශ්වර ව්‍යාපාරික ආයතන වන ඩෙයිම්ලර්, තයිසන් සහ ඩොච් බැංකුව වෙත නිෂ්පාදනයේ ලීවර බාර දීමට නොවේ." යයි බුන්ඩ් සොෂිලිස්ටර් ආර්බයිටර් (අද ජර්මානු සමාජවාදී සමානතා පක්ෂය) 1990 පෙබරවාරියේ දී නිකුත් කල ක්‍රියාමාර්ගික ප්‍රකාශයක සඳහන් කලේය.

ස්ටැලින්වාදය යනු සමාජවාදයේ නොවැලැක්විය හැකි ප්‍රතිවිපාකය යයි ප්‍රකාශ කල කුප්‍රකට බොරුවට අපි විරුද්ධ වූයෙමු: "ස්ටැලින්වාදයේ ඉතිහාසය යනු කම්කරු පන්තියට එරෙහිව සිදු කෙරුනු දැවැන්තම අපරාධවල -- සියල්ල ම සමාජවාදයේ නාමයෙන් -- ඉතිහාසයයි. . . . නැගෙනහිර යුරෝපයේ තන්ත්‍රවල බිඳවැටීම ස්ටැලින්වාදීන් පමනක් නොව සියලු ම ප්‍රති-කොමියුනිස්ට්වාදීන් ද නිෂ්ප්‍රභා කර තිබේ: අසාර්ථක වී ඇත්තේ සමාජවාදය නොව ස්ටැලින්වාදයයි."

ජනසතු දේපොල ආරක්ෂා කිරීම සහ ඒවා කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ සංවිධානය කිරීම සඳහා අපි කැඳවුම් කලෙමු. "කම්කරු පන්තියේ දැවැන්ත කැපකිරීම මගින් ගොඩනගන ලද නිෂ්පාදන ආයතන ධනපතියන්ගේ උමතු ආශාවන්ට නිකම්ම අතහැර දැමිය නොහැකිය. රාජ්‍ය දේපොල පරපුටු ස්ටැලින්වාදී කුලයේ පාලනයෙන් නිදහස් කරගෙන කම්කරු පන්තියේ පාලනය යටතට පත් කල යුතුය. . . . කම්කරු සහා ආර්ථිකයේ පාලනය අත්පත් කර ගෙන නිෂ්පාදකයන්ගේ හා පාරිභෝගිකයන්ගේ ඉල්ලීම් ඉටු කරනු පිනිස සැලසුම්ගත ආර්ථිකය ඉහල සිට පහලට ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ප්‍රතිසංවිධානය කල යුතුය."

අවසාන වසයෙන්, අප අවධාරනය කලේ මෙම එල්ලයන් අත්පත් කර ගත හැක්කේ ජාත්‍යන්තර කම්කරු පන්තියේ ඒකාබද්ධ ක්‍රියාකාරිත්වය හරහා පමනක් ම බවයි: "නැගෙනහිර යුරෝපයේ ධනේශ්වර පුනස්ථාපනය, බටහිර කම්කරුවන් සූරාකෑම දැවැන්ත පරිමානව ඉහල දමනු පිනිස නැගෙනහිර නිපුන කම්කරුවන්ගේ ලාභ ශ්‍රමය යොදා ගැනීමේ හැකියාව ධනපතියන්ට ලබා දෙමින්, බටහිර යුරෝපයේ කම්කරු පන්තිය වෙත දරුනු ප්‍රතිවිපාක ගෙන එනු ඇත. . . . වත්මන් තත්වය, ධනවාදය හා ස්ටැලින්වාදය පෙරලා දැමීම පිනිස ඒකාබද්ධ අරගලයක් තුල සියලු දේශසීමා හරහා කම්කරුවන් ඒකාබද්ධ කිරීමේ කර්තව්‍යය වෙන කවරදාකටත් වඩා හදිසි භාවයකින් මතු කරයි."

මෙම ඉදිරිදර්ශනය අද ඉහලම වැදගත්කම අත්පත් කරගනී. සමාජවාදී ක්‍රියාමාර්ගයක් සඳහා අරගලය තුල යුරෝපීය සහ ජාත්‍යන්තර කම්කරු පන්තිය ඒකාබද්ධ කිරීම වනාහි, යුරෝපය 1914 දී හා 1939 දී මෙන් යුද්ධය හා ම්ලේච්ඡත්වය තුලට යලිත් වරක් ඇද වැටීම වලකාලිය හැකි එකම ප්‍රගතිශීලී විකල්පයයි.

**පීටර් ස්වාර්ට්ස්**

© www.wsws.org